*නිවැරදි කිරීමයි* :-පළමු ඡේදයේ පස්වන පේළියේ "ආනයන" යන්න ඉවත් කර ඇත. තවද, අංක 4. හි "ඉතා" යන්න ඉවත් කර, අංක 6. හි අවසානයට "වෙබ් අඩවිය" යන්න ඇතුළත් කර ඇත.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2286/26 - 2022 ජුනි මස 29 වැනි බදාදා - 2022.06.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 85

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

10(1)(අ) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) (අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් සියලු ආනයනකරුවන්, සාදන්නන්, නිෂ්පාදකයන්, ගබඩාකරුවන්, බෙදාහරින්නන්, ඇසුරුම්කරුවන්, අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ අලෙවිකරන්නන් සහ වෙළෙන්දන් විසින්, පාරිභෝගිකයා සිල්ලර මිලට ගනු ලබන සියලු වෙළෙඳ භාණ්ඩවල අවසන් ඒකකය අඩංගු වන ඇසුරුමේ, දවටනයේ හෝ බහාලුමේ පැහැදිලිව පෙනෙන පරිදි පහත සඳහන් තොරතුරු මුද්‍රණය කිරීමෙන් හෝ ගැලවිය නොහැකි ලේබලයක් මගින් සටහන් කර ඇත්තේ නම් මිස එකී වෙළෙඳ භාණ්ඩ කිසිවක් සෑදීම, නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදා හැරීම, ඇසුරුම් කිරීම, නැවත ඇසුරුම් කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධානය කරනු ලැබේ.

1. උපරිම සිල්ලර මිල
2. බර හෝ පරිමාව
3. නිෂ්පාදිත දිනය හා නැවත ඇසුරුම් කරන්නේ නම් ඇසුරුම් කළ දිනය
4. කල් ඉකුත් වන දිනය/භාවිතයට සුදුසු අවසන් දිනය/සක්‍රීය කාලය (කල් ඉකුත්වීමක් නොවන භාණ්ඩ අදාළ නොවේ)
5. බාණ්ඩ අංකය/කේත අංකය
6. නිෂ්පාදකයාගේ නම, ලිපිනය, දුරකථන අංකය/වෙබ් අඩවිය
7. ආනයනය කරන ලද්දක් නම් ආනයනික රට, ආනයනකරුගේ/වෙළඳපලට නිකුත් කරන්නාගේ නම, ලිපිනය, දුරකථන අංකය/වෙබ් අඩවිය

මෙම විධානය වර්ෂ 2022 ජූලි මස 28 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ශාන්ත නිරිඇල්ල,
සභාපති.

2022 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.